**ශ්‍රම වාසනා අරමුදල - 2020**

**--------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

ශ්‍රම වාසනා අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.7,600,124 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, උපලේඛන අනුව පොලී ආදායම රු.8,591,293 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත් පොලී ආදායමෙහි උපලේඛණ හා මූල්‍ය ප්‍රකාශන අතර රු.991,169 ක වෙනසක් නිරීක්ෂණය විය. | පෙර වර්ෂයේ ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී ආදායම ගණනය කිරීමේදී රු.986,473 ක පොළී ආදායම වැඩියෙන් ගණනය වී තිබුණි. එම නිසා 2020 ජනවාරි 01 දිනට සමුච්චිත අරමුදලේ ශේෂයට එම ප්‍රමාණය වැඩියෙන් සටහන් වී තිබුණි. මෙම වර්ෂයේදී වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලී ආදායම, ස්ථාවර තැන්පතු පොළී ආදායම් ලැබිය යුතු ගිණුම තුලින්ම ලබා ගන්නා නිසා ඉහත වැඩියෙන් ගණනය වීම එම ගිණුම තුලින් ගැලපී වර්ෂයේ ලාභය මගින් අඩුවී තිබුණි. නමුත් වර්ෂය අවසානයේදී සමුච්චිත අරමුදලේ ශේෂය ගිණුම් ප්‍රකාශය තුල නිවැරදිව ඉදිරිපත් කර තිබේ. | පොළී ආදායම නිවැරදිව ගිණුම්ගත කර අදාළ උපලේඛන සමඟ සසඳා නිවැරදි කිරීම් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී ආයෝජනය කරන ලද රු.මිලියන 05 ක ස්ථාවර තැන්පතුවක් සඳහා ලැබිය යුතු පොලිය රු.129,808 ක් සාවද්‍ය ගණනය කිරීම හේතුවෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි ගිණුම් ප්‍රකාශන තුළ නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ඇත | එක් එක් ආයෝජනය සම්බන්ධයෙන් වෙන වෙනම පොළී ගණනය කර වාර්ෂික ආදායම ගණනය කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | 2020 දෙසැම්බර් 31 දිනට රජයේ ප්‍රදාන ලෙස අරමුදලට පවරන ලද රු.3,625,500 ක් වූ ස්ථාවර වත්කම් හා අරමුදල විසින් පැවැත්වීමට සැලසුම් කළ හා පවත්වන ලද වැඩසටහන් පිළිබඳ විස්තර ඇතුලත් කර සකස් කර තිබූ වටිනාකම රු.2,774,958 ක් වූ වෙබ් අඩවි පද්ධතිය (web based system)නම් වූ මෘදුකාංගය, හඳුනාගන්නා ලද ප්‍රතිශතයක් මත ක්‍රමක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි. | ආයෝජනයන් ලෙස හඳුනා ගන්නා ලද වෙබ් අඩවි මූලික කර ගත් පද්ධතියේ වටිනාකම ඉදිරි ගිණුම් වර්ෂයන් තුළදී ආදායම් ප්‍රකාශයට හඳුනා ගන්නා කාල පරිච්ඡේදයන් තුළ ක්‍රමක්ෂය කිරීමට කටයුතු යොදනු ලැබේ. | අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල පනත සහ 2019 අංක 15 දරන ශ්‍රම වාසනා අරමුදල (සංශෝධන) පනත | | | |
| | (i) සංශෝධිත පනතේ 3 (3)(උ)(i) හා (ii) උප වගන්ති | කම්කරු කොමසාරිස් ජනරාල්වරයා, කම්කරු විනිශ්චය සභාවක්, බේරුම්කරුවෙකු හෝ කම්කරු උසාවියක් හෝ යම් අධිකරණයක් ඉදිරියේ යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ පවරා ඇති හෝ විභාග වෙමින් පවතින යම් සේවා නියුක්තකයකුගේ සේවා නියුක්තිය අවසන් කිරීම හා සම්බන්ධ හෝ කාර්මික ආරවුලක් සම්බන්ධ නඩු කටයුතු සඳහා සේවා නියුක්තයන්ට නීතිමය සහාය ලබාගැනීමට, මූල්‍යමය සහන සැලසීමට තත්කාර්ය සඳහා සාදනු ලබන රීති මගින් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් මුදල් ප්‍රමාණයකට යටත් විය යුතු වුවත්, . මෙම නීති ආධාර ලබාදීමට අදාල රීති 2020 දෙසැම්බර් 31 දිනටත් පිළියෙල කර නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර අවශ්‍ය උපදෙස් ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කිරීමට සටහන් කර ගතිමි. | පනතේ සඳහන් අරමුණු ඉටුකර ගැනීම සඳහා එහි සඳහන් නීති ආධාර සේවා නියුක්තිකයන්ට ලබා දීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මුල් පනතේ 13 (1) වගන්තිය සහ සංශෝධිත පනත 5 (1) හා (2) උප වගන්ති | අරමුදල හා ලොතරැයි මණ්ඩලය එකඟවනු ලැබිය හැකි යම් ලොතරැයි සංඛ්‍යාවක්, ලොතරැයි වර්ග හා එසේ පවත්වන ලොතරැයිවලදී ප්‍රදානය කරන තෑගි පිළිබඳව, ඒ ලොතරැයිවලදී හිමිකම් කියා නොසිටින තෑගි සම්බන්ධව කටයුතු කරන ආකාරය පිළිබඳව, සහ ලොතරැයිවලින් ලැබෙන මුදල්වලින් අරමුදල සඳහා වෙන්කල යුතු මුදල් ප්‍රමාණය පිළිබඳව එකඟතාවයක් පැවතිය යුතු නමුත්, අරමුදල හා ජාතික ලොතරැයි මණ්ඩලය අතර එවැනි එකඟතාවයක් ඇතිකර ගෙන නොතිබුණි. | ශ්‍රම වාසනා අරමුදල හා ජාතික ලොතරැයි මණ්ඩලය, ඇති කර ගත යුතු ගිවිසුම මුදල් අමාත්‍යාංශය වෙත යැවිය යුතු බව දන්වා සිටින ලද අතර සකස් කරන ලද ගිවිසුමේ කෙටුම්පතක් කම්කරු අමාත්‍යාංශය නිර්දේශ කර ඇති අතර 2017/01/17 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමත කරන ලදී. ඒ අනුව, 2017/02/28 වන දින එවකට කම්කරු අමාත්‍යාංශයේ ලේකම් විසින් මේ පිළිබඳව දන්වා මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිපියක් යවන ලදී. නැවත 2020/01/07 වන දින මේ පිළිබඳ දන්වා සිහිකැඳවීම් ලිපිද යවන ලදී. 2021/03/25 වන දින සාකච්ඡාවක් මුදල් අමාත්‍යාශය හා සිදු කිරීමට ලිපියක් යොමු කර ඇත. | පනතේ විධිවිධාන අනුව ලොතරැයි මණ්ඩලය සමඟ ගිවිසුම්ගතවී ලොතරැයි පවත්වාගෙන යාමට කටයුතු කල යුතු වීම. |
| (iii) | මුල් පනතේ 14 වන වගන්තිය සහ සංශෝධිත පනත 6 (2) ) උප වගන්තිය | මණ්ඩලයේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කෙරෙහි බලපවත්වන හෝ ඊට සම්බන්ධ හෝ අනුෂංගික කාරණා සම්බන්ධයෙන් හෝ මේ පනත මගින් රීති සෑදීමේ බලය දී ඇති හෝ අවශ්‍ය යැයි මණ්ඩලය සලකන රීති පිළියෙල කර මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණද එම රීති 2021 අප්‍රේල් 08 දින දක්වාම ගැසට් පත්‍රයේ පල කර නොතිබුණි. | කමිටුවක් මඟින් රීති කෙටුම්පත් කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා මුදල් අමාත්‍යාංශය වෙත ගැසට් කිරීමට අදාළ කටයුතු වෙනුවෙන් 2020/12/22 වන දින යොමු කර ඇත. මේ පිළිබඳ 2021/03/25 වන දින ද නැවත විමසීමක් කරන ලද අතර ඒ සඳහා අවශ්‍ය කටයුතු කරමින් පවතී. | පනතේ විධිවිධාන අනුව කටයුතු කර අදාල රීති සාදා බලගැන්වීමට කළමණාකරණය විසින් කටයුතු කලයුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16:2 වගන්තිය | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාද ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතු වුවත් මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ජාතික විගණන පනතේ ප්‍රතිපාදන අනුව කටයුතු කල යුතු වීම. |

## 1.7 ආයෝජන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදලේ මෙහෙයුම් කටයුතු සාර්ථකව පවත්වාගෙන යාම සඳහා රඳවා තබාගත යුතු බැංකු ශේෂය හඳුනාගෙන අතිරික්ත මුදල් කෙටිකාලීනව ආයෝජනය කිරීමේ ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ සෑම මාසයක් අවසානයේම රු.මිලියන 2 සිට රු.මිලියන 14 ක් දක්වා වූ මුදල් ප්‍රමාණයන් ජංගම ගිණුමේ නිෂ්කාර්යව පැවතුණි. එමගින් අරමුදලට උපයාගත හැකිව තිබූ පොලී ආදායම් අහිමි වී තිබුණි. | ශ්‍රම වාසනා අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සති අන්ත දිනවලදී පමණක් REPO ලෙස කෙටිකාලීන ආයෝජනය කරන ලදී. 2020 ජූලි 31 දින පැවති රු.12,959,389 ක් වන ශේෂය COVID-19 විශේෂ ව්‍යාපෘතිය සඳහා යෙදවීමට අවශ්‍ය බැවින් සතියක පමණ කාලයක් තබාගෙන 2020.අගෝස්තු 30 දින REPO ලෙස ආයෝජනය කරන ලදී.<br>2020.11.30 දින ජංගම ගිණුමේ ශේෂය වූ රු.6,561,866 වන මුදල 2020.12.02 දින ශිෂ්‍යත්ව වැඩසටහන වෙනුවෙන් රඳවාගන්නා ලදී. | බැංකු ශේෂය හඳුනාගෙන අතිරික්ත මුදල් කෙටිකාලීන ආයෝජන ක්‍රමයක ආයෝජනය කිරීමට කටයුතු කල යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය බැංකු 03 ක ආයෝජනය කර තිබූ රු.95,000,000 ක ස්ථාවර තැන්පතු කල්පිරී තිබූ අතර, නැවත ආයෝජනය කිරීමේදී පොලී අනුපාත සංසන්දනය කර වඩාත් ලාභදායී ආයෝජන මාර්ග තෝරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2020/03/18 වන දින සිට කොරෝනා වසංගත කාල සීමාව තුළ ස්ථාවර තැන්පතු කල් පිරීමේ දී රාජ්‍ය බැංකු තුළින් පොළි අනුපාත කැඳවීම් සිදු කිරීමට නොහැකි තත්ත්වයක් උදාවුණි. එම නිසා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි ස්ථාවර තැන්පතු පවතින බැංකුවෙහිම නැවත ආයෝජනය කිරීම සිදු කරන ලදී. ශ්‍රම වාසනා අරමුදලේ ස්ථාවර තැන්පතු වලින් රු.මිලියන 83ක ප්‍රමාණයක් ඒ වන විට ඉහළ පොළී අනුපාතිකයක් පැවති මහජන බැංකුව තුළ ම නැවත ආයෝජනය කිරීම සිදු කර ඇත.<br>මීට පෙර සෑම වර්ෂයකදීම පොළී අනුපාත කැඳවා ඉහළ පොළී අනුපාතිකයක් ඇති බැංකුවෙහි ආයෝජනය කිරීමට කටයුතු කරන ලදී. | වඩා ලාභදායී ආයතනවල ආයෝජන අවස්ථා සොයාබලා ආයෝජනය කල යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.12,330,517 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.21,832,739 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.9,502,222 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පූර්ව වර්ෂයේ රු.මිලියන 73.2 ක් වූ අරමුදලේ ආදායම සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 37.8 දක්වා අඩුවීම හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

(අ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී ශ්‍රම වාසනා ලොතරැයි ආදායම රු.මිලියන 60.2 සිට රු.මිලියන 30 දක්වා සියයට 50 කින් පහත වැටී තිබුණි.

(ආ) අපේක්ෂිත පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකිවීම නිසා වර්ෂය සඳහා වූ ප්‍රාග්ධන වියදම පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 75 කින් පහත වැටී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 වර්ෂයට අදාලව අභ්‍යන්තර විගණන සැලැස්මක් පමණක් පිළියෙල කර තිබූ නමුත් අභ්‍යන්තර විගණනයන් සිදුකර වාර්තා නිකුත් කර නොතිබුණි. තවද, 2020 මාර්තු මාසයෙන් පසුව අරමුදලේ අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර පුරප්පාඩුව පැවතුණි. | ශ්‍රම වාසනා අරමුදලෙහි පුරප්පාඩු වූ අභ්‍යන්තර විගණක තනතුරට නව නිලධාරියෙකු නැවත පත් කරන ලෙස 2020/10/19 දින මුදල් අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටින ලද අතර ඉක්මනින් පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන බව අප වෙත දන්වන ලදී. | අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වීම නිකුත් කරන විගණන විමසුම්වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වීම. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) COVID - 19 හේතුවෙන් රැකියා අහිමි වූ සේවා නියුක්තිකයන්ගේ දූදරුවන් 2,500 ක් සඳහා පාසල් බෑග් සහ උපකරණ කට්ටල ලබාදීමට රු.6,250,000 ක ඇස්තමේන්තුවක් සකස් කර කම්කරු බල ප්‍රදේශ 11 ක් ආවරණය වන පරිදි කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් | COVID-19 හේතුවෙන් රැකියා අහිමි වූ සේවා නියුක්තිකයන්ගේ දූ දරුවන් 2500 ක් සඳහා පාසල් බෑග් හා උපකරණ කට්ටල ලබා දීමට අදාළව තොරතුරු කැඳවා තිබුණද අධ්‍යක්ෂ මණ්ඩලය ලබා දුන් උපදෙස් පරිදි එම වැඩසටහන නොපැවැත්වුණි. | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගෙන කාලීන අවශ්‍යතා පරිදි, විධිමත්ව වැඩසටහන් පැවැත්වීමට කටයුතු කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | අවශ්‍ය තොරතුරු හා අයදුම්පත් කැඳවා තිබුණු අතර ඒ අනුව 2020 දෙසැම්බර් 31 දින වන විට අයදුම්පත් 330 කට අධික ප්‍රමාණයක් ලැබී තිබුණි. එම සමාජීය වගකීම් ඉටුකිරීම කාලීන අවශ්‍යතාවයක් මෙන්ම පනතේ 6 (ඉ) උප වගන්තියේ අරමුණුවලට වඩාත් යෝග්‍ය වූ වැඩසටහනක් වුවද 2021 මාර්තු 15 දිනටත් එම වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි. | | |
| (ආ) | සේවා නියුක්තිකයන්ගේ සුභසාධනය සඳහා විශිෂ්ඨ සේවයක් කර ඇති පුද්ගලයින් ඇගයීමේ උත්සවයක් පැවැත්වීමට 2017 අගෝස්තු 15 දින කමිටුවක් පත් කර තිබූ අතර අදාල කමිටු වාර්තාව මාස 6 ක් ප්‍රමාද වී තිබුණි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මුලින්ම තීරණය කර තිබූ පරිදි සේවායෝජකයන් 03 දෙනෙකු, සේවානියුක්තිකයන් 04 දෙනෙකු හා රාජ්‍ය නියෝජිතයින් 03 දෙනෙකු වශයෙන් ත්‍රෛපාර්ශවයම නියෝජනය වන පරිදි පුද්ගලයින් 10 ක් තෝරාගත යුතු වුවද පත්කරන ලද කමිටුව විසින් තීරණය කර තිබූ පරිදි වෘත්තීය සමිති කටයුතුවල වසර 35 කට වැඩි කාලයක් යෙදී සිටි පුද්ගලයින් 10 ක් පමණක් පුවත්පත් දැන්වීම් පලකර තෝරාගෙන තිබුණි. කෙසේවුවද, 2020 දෙසැම්බර් 31 දක්වා මෙම උත්සවය සඳහා පූර්ව වීඩියෝගත කිරීම්, පුවත්පත් දැන්වීම්, කමිටු සාමාජික දීමනා ඇතුළු මූලික වියදම් සඳහා රු.708,897 ක් වැයකර තිබුණද 2021 මාර්තු 15 දිනටත් එවැනි උත්සවයක් පවත්වා නොතිබුණි. | ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් උක්ත වැඩසටහන පැවැත්වීමට සැලසුම් කර තිබූ අතර මුළු වැඩසටහන වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව ප්‍රතිපාදන වෙන් කිරීම් සිදු කර ඇත.<br>උත්සවය පැවැත්වීමට අදාළ මූලික කටයුතු වෙනුවෙන් මෙම මුදල වැය කර ඇත. මෙම වියදම දරා සිදු කරන ලද වීඩියෝව ඉදිරි උත්සවයේදී භාවිතා කිරීමට නියමිත බැවින් වැය කර ඇති මුදල අපතේ යාමක් සිදු නොවේ. | වියදම් ඇස්තමේන්තු සකස් කර විධිමත් අනුමැතියක් ලබා උත්සවය පැවැත්වීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | 2016 වර්ෂයට පෙර වැඩසටහන් සඳහා බෙදාදීමට මිලදී ගන්නා ලද රු.60,464 ක් වටිනා උපකරණ තොග අයිතමයන් 10 ක් 2020 දෙසැම්බර් 31 දිනටත් චලනය නොවන තොග අයිතමයන් ලෙස ගබඩාවේ පැවතුණි. | මීට ඉහත වසරවලදී සිදු කරනු ලැබූ වැඩසටහන් වලට අදාළව මෙම තොග ප්‍රමාණයන් මෙසේ ඉතිරිව තිබුණද, මේ වන විට මෙම තොග ප්‍රයෝජනවත්ව පැවති වැඩසටහන් වලදී නිකුත් කර ඇති අතර ඉතිරිය දඹුල්ලේ පැවති වැඩසටහන සඳහා නිකුත් කරන ලදී. | චලනය නොවන තොග අදාල අනුමැතිය ලබා ගැනීමෙන් පසුව පොත්වලින් ලියාහැරීමට හෝ වෙනත් ආකාරයට අපහරණය කිරීමට හෝ කටයුතු කළ යුතුය. |